සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංගකලාව** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4) | 02. (2) | 03. (3) | 04. (1) | 05. (4) | 06. (2) | 07. (2) | 08. (4) | 09. (2) | 10. (1) |
| 11. (5) | 12. (4) | 13. (3) | 14. (3) | 15. (5) | 16. (5) | 17. (2) | 18. (3) | 19. (1) | 20. (1) |
| 21. (2) | 22. (1) | 23. (2) | 24. (2) | 25. (2) | 26. (1) | 27. (2) | 28. (5) | 29. (2) | 30. (2) |
| 31. (1) | 32. (3) | 33. (4) | 34. (3) | 35. (1) | 36. (1) | 37. (1) | 38. (3) | 39. (1) | 40. (2) |

(ලකුණු 40)

## II කොටස

01. (i) ✶ ප්‍රසංශාත්මකව නැරඹිය හැකිය. ✶ සජීවී මාධ්‍යයක් වීම. ✶ නිශ්චිත ස්ථානයක එනම් වේදිකාවක ඉදිරිපත් කිරීම. ✶ නිශ්චිත කාල පාරසයක් යොදා ගැනීම. ✶ ඉදිරිපත් කරන වේලාවේ දී පමණක් පැවතීම. ✶ අභිනය භාවිතා කිරීම (ල. 4)

(ii) සංගීතය, නර්තනය, බැලේ, ඔපෙරා, මුද්‍රා මෙයින් 2 ක් උදාහරණ ලෙස ගනිමින් එයින් නාට්‍ය කලාව වෙනස් වන අයුරු දක්වා තිබීම. (ල. 5)

(iii) ✶ සතර අභිනය භාවිතය ✶ අවස්ථාවක් හෝ සිදුවීමක් ඉදිරිපත් කිරීම. ✶ කථා වින්‍යාසයක් දක්නට ලැබීම. ✶ නාට්‍ය ශෛලියකට අනුගත වීම. ✶ අනුශාංගික අංග යොදාගැනීම. ✶ සමාජ විවරණ (කාලීන) කථා පුවත් යොදාගැනීම. (ල. 6)

02. (i) කොහොඹාකංකාරිය, රටයැකුම, දහඅට සන්නිය, සූනියම් යාගය, පහන්මඩු, ගම්මඩු ....... දක්වා තිබීම. (ල. 4)

(ii) සමාරෝපණය, සංවාද භාවිතය, අනුකරණය, අනුරූපණය, රංගභූමි භාවිතය, රංගවස්ත්‍රාභරණ, රංගභාණ්ඩ, වාද්‍ය භාණ්ඩ ආදිය නිදසුන් මගින් පැහැදිලි කිරීම. (ල. 5)

(iii) පහන් මඩුව හා කිරිමඩුව............ පිළිබඳ විස්තර ලියා තිබීම. (ල. 6)

03. (i) ✶ නාට්‍ය ධර්මී ලෝක ධර්මී ශෛලීන් 2 ම යොදාගැනීම. ✶ හාස්‍ය දනවනායුරින් චරිත නිරූපණය තීව්‍ර ලෙස යොදාගෙන තිබීම. ✶ දේශපාලන අර්බුද වර්තමානයට ගැලපෙනයුරින් ඉදිරිපත් කිරීම. ✶ කාව්‍යමය බස්වහරක් යොදාගෙන තිබීම ආදී ලක්ෂණ කෙටියෙන් විස්තර කොට තිබීම. (ල. 4)

(ii) රාජ්‍ය තන්ත්‍රයේ ක්‍රියාපිළිවෙත් කෙරෙහි රජුට එකහෙලා තීරණ ගැනීමේ නොහැකියාව. ඇමති මණ්ඩලයේ විරෝධතා ඔවුන්ගේ පරම්පරාගත අදහස් ආකල්ප ඒකකාරී රටාවන් (වන්දිභට්ට ගායනා) ........ ආදිය සවිස්තරව දක්වා තිබීම. (ල. 5)

(iii) පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න. (ල. 6)

04. (i) ✶ සර්ණාටක සංගීතය ඇලුම්කළ ප්‍රේක්ෂකයා හිංදුස්ථානි සංගීතයට යොමු වීම. ✶ එකම නාඩගම රාත්‍රී කිහිපයක් රංගගත කිරීම. ✶ පූර්ව රංගය හා ස්ථාවර පාත්‍රයින් දිනපතා පැමිණීම. ✶ නාට්‍ය රචකයින්ගේ දුර්වලතා. ✶ දුරාචාර සිදුවීම. ✶ නාඩගම් පිටපතෙහි වචන වල තිබි කර්කෂ භාවය. මින් කරුණු 04 ක් දක්වා තිබීම. (ල. 4)

(ii) ✶ පැය 2 3කට සීමාවීම. ✶ හින්දුස්ථානි සංගීතය යොදාගැනීම. ✶ විචිත්‍රවත් ප්‍රේක්ෂාව යොදා ගැනීම. ✶ නවීන තාක්ෂණික ක්‍රම භාවිතය ✶ ස්ත්‍රී චරිත ස්ත්‍රීන් විසින් ම නිරූපණය කිරීම. ✶ නාට්‍යෝචිත සිදුවීම් දක්නට ලැබීම. ✶ ප්‍රභූ සමාජයේ අනුග්‍රහය. (ල. 5)

(iii) මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ අනුවර්තන, පරිවර්තන හා ස්වතන්ත්‍ර නිර්මාණ දක්වා නාට්‍ය කලාවට සිදු වූ සේවය විස්තර කොට දැක්වීම. (ල. 6)

05. (i) ඊඩිපස් රජ නාට්‍යයේ කථාව හා සම්බන්ධයි. එම පුරාවෘත්තය දක්වා තිබීම. (ල. 4)

(ii) ✶ ග්‍රීක දේව නීතියට අනුව මලවුන් මිහිදන් කළ යුත්තේ ගෞරවාන්විතවය. රාජ නියෝගය වන්නේ ද්‍රෝහියෙකුට එවැන්නක් හිමි නොවීමයි. ✶ දේව නීතිය හා රාජ නීතිය අතර ගැටුම.

(iii) ✶ ග්‍රීක, ට්‍රැජඩි, කොමඩි, සැටර් ලෙස නාට්‍ය වර්ග 03 කි. අග්‍රගන්‍ය නාට්‍ය විශේෂයසේ ගැනෙන්නේ ට්‍රැජඩිය. තෙස්පීස්ගෙන් පසුව ෆ්‍රයිනිඩෝස්, බොයිරිමෝස්, ප්‍රටිනස් යන අය නාට්‍ය කලාවේ වර්ධනයට සේවය කළා. මොවුන්ගේ කෘතීන් දක්නට නොලැබොනාතර, ඊස්කිලස් ග්‍රීක ට්‍රැජඩි වර්ධනයට විශිෂ්ට සේවයක් කළා. දෙවන නළුවෙකු හඳුන්වා දීම, ප්‍රථම නාට්‍ය ත්‍රිකය රචනාකිරීම, ශෝක ජනක නාට්‍යයේ ආරම්භකයා ය. සොෆෝක්ලීස් නාට්‍ය ඉහළ තලයට ගෙන එන ලදී. යුරිපිඩීස් ශෝක ජනකයේ පරිහානිය සිදුවූ බව සඳහන් කිරීම. (ල. 6)

06. (i) සකුන්තලා පුරාණෝක්තිය කෙටියෙන් දක්වා තිබීම. (ල. 4)

(ii)

| | |
|---|---|
| ආරම්භ | කථාවස්තු විකාශනයයි. නායක නායිකා අරමුණු ප්‍රථම වරට ප්‍රකාශකරනාවස්ථාව |
| යත්ත | ආරම්භය නිසා එය ඉදිරියට ගෙන යාමේ උත්සහයයි. |
| ප්‍රාප්තාශා | නාට්‍යයේ උච්චතම අවස්ථාවයි. නායක නායිකා අරමුණු ඉටුකරගැනීමේ දී අනපේක්ෂිත බාධා පැමිණීම. |
| නියතාප්ති | බාධාවන් මග හැරී අරමුණු කරා එළඹීම. |
| ඵලාගම | නායක නායිකා අරමුණු ඉටු වීම. |

මෙම අවස්ථා 05 නිදසුන් මගින් පැහැදිලි කිරීම. (ල. 5)

(iii) බීජ, බිංදු, පතාක, ප්‍රකරි, කාර්ය.

නිදසුන් මගින් පහදා තිබීම. (ල. 6)

| | |
|---|---|
| බීජ | කථා වස්තුව කෙටියෙන් පැවසීම. |
| බිංදු | නාට්‍යයේ ක්‍රියාකාරී බලවේගය |
| පතාක | ප්‍රධාන කතා පුවතක් රසය තීව්‍ර කිරීමට සම්බන්ධ වන අතුරු කථා පුවත. |
| ප්‍රකරි | එක් අවස්ථාවකට පමණක් සීමාවන චරිත |
| කාර්ය | අවසාන ඵලයයි. |

The National e-learning Portal for The General Education